# නාථ දේව වන්දනය ථෙරවාද බුදුසමයට පටහැනි සඞ්කල්පයක් ද?

නාලක ජයසේන[1]

## හැඳින්වීම

බුදුසමය ලෝක නිර්මාපක බ්‍රහ්මයකු හෝ සර්වබලධාරී දෙවියකු ප්‍රතික්ෂේප කරනු ලබන හේතුඵල ධර්මතාව පදනම් කරගත් ඉගැන්වීමකි. තව ද බුදුසමය බාහිර අධිකාරියක පැවැත්ම අඞ්ගුත්තරනිකායේ තිත්ථායතන සූත්‍රයෙන් ප්‍රතික්ෂේප කොට ඇත. එහෙත් කර්මානුරූප ව සංසාරයේ පහළ වන දේව නම් සත්ත්ව කොට්ඨාසයක පැවැත්ම බුදුසමය පිළිගන්නා අතර, බුදුහිමි දේවාතිදේව හා බ්‍රහ්මාතිබ්‍රහ්ම වන්නේ ය. එහෙත් දේව ඇදහිල්ල මුල් බුදුසමයේ දැකිය නො හැකි අතර, දෙවියන්ට පින් දීමේ අගය සහ කුසල්කාමී මනුෂ්‍යයාට දේව රැකවරණය හිමි වන බව මූලික බුද්ධදේශනාවලින් අනාවරණය කරගත හැකි ය. එහෙත් ශ්‍රී ලංකාවේ ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය අනුගාමිකයෝ වර්තමානයේ මුල් බුදුසමයේ නො පැනෙන විවිධ දෙවිදේවතාවුන් වන්දනය සිදු කරන බව දැකිය හැකි ය. එය හින්දු සංස්කෘතික බලපෑම ඔස්සේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත බව ඉතිහාසය නිරීක්ෂණයෙන් පසක් වෙයි. ඒ අතර මෛත්‍රී බෝධිසත්ත්ව වන්දනය සුවිශේෂ ස්ථානයක් ගනු ලබන්නේ මෛත්‍රී බෝධිසත්ත්ව සඞ්කල්පයෙන් පරිණාමය වූ නාථ දෙවියන් හින්දු දෙවියකු නො වන බැවිනි. නාථ දේව වන්දනය ලංකාව තුළ මුල් බැස ගන්නා කාලාවකාශය පිළිබඳ ව විවාද ඇති නමුත් පොදුවේ ගත් කල එය ශ්‍රී ලංකාව තුළ සිදු වූ වෛතුල්‍යවාදී පරිවර්තනය සමඟ මතු වූවක් බව පෙනෙයි. ඒ ඔස්සේ ලංකා සමාජයේ ථෙරවාද බුදුසමය මහායාන බුදුසමය සමඟ පොළොන්නරුව යුගයේ දී අතිපිහිත වීම වැදගත් වෙයි. මහායාන සම්ප්‍රදායේ අවලෝකිතේශ්වර දේව ඇදහිල්ල ශ්‍රී ලංකාව තුළ නාථ දෙවියන් වශයෙන් විකාසනය වී ඇති බව මේ අනුව තහවුරු වෙයි. අවලෝකිතේශ්වර යනු මහායාන බෝධිසත්ත්වවරයකු වන අතර මහායාන, ථෙරවාද, තන්ත්‍රයාන හා වජ්‍රයාන යන බෞද්ධ සම්ප්‍රදාය සියල්ලෙහි ම අවලෝකිතේශ්වර ඇදහිල්ල විවිධාකාරයෙන් විද්‍යමාන වෙයි. ඒ සියල්ලෙහි මූලය වශයෙන් මෛත්‍රී බෝධිසත්ත්වයන් හඳුනා ගත හැකි ය. වර්තමානයේ දානමය ආදී පුණ්‍යකර්ම අවසානයේ දී මෙතේ බුදුන් දැක නිවන් දැකීම ප්‍රාර්ථනා කිරීම තුළින් මෙත් බෝසත් සඞ්කල්පය සහ සිංහල බෞද්ධ සංස්කෘතියේ අවියෝජනීය සම්බන්ධය දැකිය හැකි ය.

ථෙරවාද බුදුසමය අනුව බෝධිසත්ත්වයකු යනු බුද්ධ බීජාඞ්කුරයක් හෙවත් සම්බුදුවරයකුගෙන් සම්බුද්ධත්වයට නියත විවරණ ගත් පුද්ගලයකු ය. බුද්ධවංශ දේශනාවේ දී ගෞතම බුදුරජාණන් වහන්සේ ඒ ගැන දේශනා කොට ඇති අතර, සච්චගවේසී සිද්ධාර්ථයන්ගේ අනභිසම්බුද්ධ බෝසත් කාලය ගැන ගෝතම සූත්‍රයේ දී ද දැකීමට හැකි ය. එසේ ම මතු බුදුවන මෛත්‍රී බෝධිසත්ත්වයන් ගැන ද අනාගතවංශ දේශනාවේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත. නාථ දෙවියන් හඳුනා ගැනීමේ දී එම මෛත්‍රී බෝධිසත්ත්වයන් සහ අවලෝකේශ්වර බෝධිසත්ත්වයන්ගේ සම්බන්ධය ඉතා වැදගත් වන්නේ නාථ දේව

[1]. Post Graduate Research, Department of Sinhalese, University of Colombo.

සඞ්කල්පය පරිණාමය වී වර්තමානය වන විට එම සඞ්කල්පත්‍රය ම එක ප්‍රවාහයක් වශයෙන් පවතින බැවින් ය.

**පර්යේෂණ අරමුණු**

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ මෛත්‍රී බෝධිසත්ත්ව වන්දනය ථෙරවාද බුදුසමයට අනුව සාවද්‍ය සඞ්කල්පයක් (misconception)? යන්නට පිළිතුරක් යෝජනා කිරීම යි. එහි ලා වත්මන් සිංහල බෞද්ධ සමාජයේ පැනෙන ථෙරවාද බුදුසමයෙහි ලා මෛත්‍රී බෝසතුන්ගේ සහ නාථ දෙවියන්ගේ භූමිකාව විභාග කරනු ලැබෙයි. ඒ ඔස්සේ සමකාලීන මෙත් බෝසත්-නාථ දේව වන්දනය අරබයා නව ප්‍රවාදයක් ජනනය ද අපේක්ෂිත ය.

**පර්යේෂණ ක්‍රමවේදය**

**(පර්යේෂණ ගැටලුව/ පර්යේෂණ උපන්‍යාසය/ පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය/ පර්යේෂණ සෛද්ධාන්තික රාමුව)**

මෙහි ලා පර්යේෂණ ගැටලුව වන්නේ මෛත්‍රී බෝධිසත්ත්ව වන්දනය ථෙරවාද බුදුසමයේ සඞ්කල්ප සමඟ ගැටෙන්නේ ද? යන්න යි. පර්යේෂණයේ උපන්‍යාසය වන්නේ ශ්‍රී ලංකාවේ මෛත්‍රී බෝසත්-නාථ දේව අභිවාදනය බෞද්ධ දෙවියකු යන සඞ්කල්පය පෙරදැරි ව සිදු කරයි යන්න යි. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ගුණාත්මක විධික්‍රමය යටතේ පුස්තකාල අධ්‍යයනය යොදා ගැනෙයි. ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ඓතිහාසික මූලාශ්‍රය (අභිලේඛන, සන්දේශකාව්‍ය...) සහ ද්විතීයික මූලාශ්‍රය වශයෙන් ශාස්ත්‍රීය මූලාශ්‍රය යොදා ගැනෙයි. මෙම තේමාවෙහි ලා සාහිත්‍යයික විමර්ශනයට ගෝචර වන අධ්‍යයන දුර්ලභ වන අතර, ජෝන් හෝල්ට්, සෙනරත් පරණවිතාන, ටී. ජී. ඒ. තල්වත්ත වැනි අයගේ විග්‍රහ ඔස්සේ මෙත් බෝසත් නාථ දේව වන්දනයට ඉතිහාසයේ තිබූ ආස්ථානය හෙළි කරගනු ලැබී ය. මෙහි සෛද්ධාන්තික රාමුව වශයෙන් ඓතිහාසික ප්‍රත්‍යවේක්ෂණය යොදා ගැනෙයි.

**පර්යේෂණ සාකච්ඡාව**

අභිචාර සිදු කරමින් උභය ලෝකාර්ථය සාධනය  කර ගැනීම මානව සංස්කෘතික චර්යාවේ ම අඞ්ගයක් බව මානවවිද්‍යාත්මක සහ සමාජවිද්‍යාත්මක කියැවීම යි. නාථ දේව වන්දනය තදාශ්‍රිත ව ශ්‍රී ලංකා සමාජය සම්මර්ශනයේ දී ද ඒ සත්‍යාපනය වෙයි. නාථ දෙවියන් බෝධිසත්ත්ව තත්ත්වයේ සිට ක්‍රමික ව දේවත්වයට පත්වීම ඉතිහාසයේ සිදුව ඇති සංසිද්ධිය යි (තල්වත්ත 2018). එසේ ම ලංකාවේ රාජ්‍යත්වය විෂයෙහි ලා නාථ දෙවියන්ගේ භූමිකාව ඉතාම සුවිශේෂ වෙයි (හෝල්ට් 1994). ශ්‍රී ලංකාව පුරා ම නාථ දෙවියන් මෙත් බෝසතුන් හා අවලෝකිතේශ්වර දෙවියන් වෙනුවෙන් ඉදි කළ ප්‍රතිමා සහ දේවාල රාශියකි. එම ස්ථාන සිතියම නිරීක්ෂණයේ දී පැහැදිලි වන කරුණක් වන්නේ ලංකාව පුරා ම මෙත් බොසත් නාථ දේව වන්දනය සෑම රාජධානියක ම පාහේ තිබී ඇති බව යි. වර්තමානය වන විට මෙත් බෝසත් සඞ්කල්පයෙන් ප්‍රභින්න වූ නාථ දෙවියන් හා උන්වහන්සේ වටා බැඳුණු නාථ දේව මණ්ඩලය රට පුරා අභිවන්දනයට පොදු හා පෞද්ගලික යන තල දෙකෙන් ම සිදු වන බව දැකිය හැකි ය.

2010-2020 දශකය තුළ නාථ දේව විශ්වාසය නැවතත් තදින් හා නව ප්‍රවේශයකින් ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත විය. නාථ දෙවියන් සමග ආධ්‍යාත්මික ව සම්බන්ධ වීමෙන් රජරට වකුගඩු රෝගයට හේතුවක් වශයෙන් ආසනික් සොයා ගත් බවට ඇති වූ ප්‍රබල සංවාදය එහි ලා විශේෂ තැනක් ගනියි. එසේ ම නාථ දේව මණ්ඩලය යන සඞ්කල්පය වත්මන් සමාජයේ ජනගත වූ අතර, දේශපාලනික ව ද එම සඞ්කල්පයට වටිනාකමක් ලැබීම මෙකල සිදු වූ සුවිශේෂ සංසිද්ධියකි. එය තහවුරු වන්නේ ශ්‍රී ලංකාවේ බෞද්ධ ජනතාව විශ්වාස කරන පරිදි ලොව බලවත් ම ස්ථානය ලෙස සලකන තථාගතයාණන් වහන්සේගේ ද්‍රෝණයක් ධාතු වැඩ හිඳින රුවන්මැලි සෑයේ දී ශ්‍රී ලංකාවේ හත්වන විධායක ජනාධිපතිවරයා දිවුරුම් දෙනු ලැබුවේ නාථ දේව මණ්ඩලයට අයත් බව සලකන ගැමුණු රජතුමාගේ පිළිරුව අබියස දී වීම යි. ගැමුණු රජතුමා මෛත්‍රී බුදුරදුන්ගේ ශ්‍රාවකයකු බව බෞද්ධ විශ්වාසය යි. එසේ ම එම මැතිවරණය වෙනුවෙන් නාථ දෙවියන්ට ද විශේෂ පුදපූජා සිදු කළ බවට ද සාක්‍ෂ්‍ය ඇත. මහනුවර යුගයේ දී රජවරු දිවුරුම් දීම මහනුවර ශ්‍රී නාථ දේවාලයේ දී සිදු ව තිබීම ද නාථ දේව වන්‍දනය සහ දේශපාලනය අතර අතීත සම්බන්‍ධය විශද කරන්නකි. ඓතිහාසික ව ගත් කල රාජ්‍යාරක්‍ෂාවට නාථ දේවාශීර්වාදය පැතීම ගැන ගිරා සන්‍දේශය එක් සාක්‍ෂ්‍යයකි. එහි **"පසිඳු තරිඳු මෙන් මුළු ලොව නිති බැබැළී නතිඳු සිනිඳු තුනු කැල්මෙන් වන කෙහෙළී"** ලෙස දැක්වෙන අතර, 'නතිඳු' යනුවෙන් හඳුන්වන්නේ සන්‍දේශ ප්‍රතිග්‍රාහක නාථ දෙවියන් ය. එසේ ම මෛත් බෝසතුන් වෙනුවෙන් මෑතකාලීන ව ඉදි වූ ප්‍රතිමා ද දැකගත හැකි ය.

සිංහල බෞද්ධ ලෝකදෘෂ්ටියට අයත් දේව ධුරාවලියේ දී නාථ දෙවියන්ට ඇති වැදගත්කම වන්නේ නාථ දේව වන්‍දනය තුළ සිදු කරනු ලබන සියලුම අභිචාර සමාජවිද්‍යාත්මක ව සුදු (යහපත්) ගණයට අයත් ඒවා පමණක් වීම යි. වර්තමානය වන විට නාථ දේව වන්‍දනයේ දී මෛත් බෝසත් නාථ දේව පූජා වශයෙන් සිදු කරනු ලබන පහන් පූජා, දේව කන්නලව් ආදිය ඔස්සේ රෝගපීඩාවලින් මිදීමේ පටන් විභාගාදිය සමත්වීම ඇතුළු පුළුල් පරාසයක පෞද්ගලික ලෞකික අපේක්‍ෂා පැතීම දැකිය හැකි ය.

මෛත් බෝසත් නාථ දේව සඞ්කල්පය විභාගයේ දී මෛත්‍රී බෝධිසත්‍වයන්, නාථ දෙවියන් සහ අවලෝකිතේශ්වර බෝසතුන් යන තිදෙනා ඓතිහාසික ව නිරූපණය වී ඇති ආකාරයේ ඒකමිතියක් නොමැති බව පසක් වෙයි. ගඩලාදෙණිය සෙල්ලිපියේ නාථ සහ මෛත්‍රී යන නාමද්වය ම විශද වන අතර, අස්ගිරි විහාරලිපියේ ලෝකේශ්වරනාථ ලෙස පැනෙයි. වර්තමාන ඇසළ පෙරහැරේ නාථ දේවාල පෙරහැරට විශේෂ ආස්ථානයක් හිමි වන අතර, පළමුව ගමන් ගන්නේ නාථ දේවාල පෙරහැර ය. එහි දී මහනුවර ශ්‍රී නාථ දේවාලයේ බස්නායක නිලමේ සමඟ පස්ගම, දොඩම්වල හා වේගිරිය නාථ දේවාලයේ බස්නායක නිලමේවරු ද ගමන් ගනිති. එසේ ම අලුත් අවුරුදු මඞ්ගල්‍යයේ ඖෂධීය නානු බෙදීම ඇතුළු වැදගත් කරුණු රාශියක් මහනුවර නාථ දේවාලය කේන්‍ද්‍රගත ව අදටත් ක්‍රියාත්මක ය. එනයින් ගත් කල ථෙරවාද සම්ප්‍රදාය සහ සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ මෛත් බෝසතුන්ට සහ නාථ දෙවියන්ට හිමි වන ස්ථානය ඉතා ඉහළ එකකි.

නිර්වාණය අරමුණු කරගත් මුල් බුදුසමයෙහි දේව වන්‍දනයට වඩා දේවගුණ අනුස්මෘතිය නිර්දිෂ්ට ය. දේවතානුස්සති භාවනාවේ දී දෙවිවරු සතු සද්ධා සීලාදී ගුණ මෙනෙහි කරයි. එනයින් ගත් කල මතු බුදුවන මෛත් බෝසතුන් දැනට සංතුසිත නමින් තුසිත දෙව්ලොව වැඩ වසයි. මෛත් බෝසතුන් සහ නාථ

දෙවියන් අතර ඇති අනුපූරක සම්බන්ධතාව අනුව බලන කල දේවතානුස්සති භාවනාවේ දී එම දේවගුණ ද සිහිපත් වීම සිදු වෙයි. දෙවියන්ට පින් දීම පංචබලි අතරට ගැනෙන්නක් වන අතර, රතන සූත්‍රය, සක්කනමස්ස සූත්‍රය වැනි සූත්‍ර තුළ ථෙරවාදයෙන් මතුවන දෙව් මිනිස් සබඳතා හෙළි කරගත හැකි ය.

**පර්යේෂණ නිගමනය**

පර්යේෂණ ආවේෂණ වශයෙන් නාථ දෙවියන්ට වර්තමාන ශ්‍රී ලංකාවේ සමාජයේ ඇති පිළිගැනීම මෙත් බෝසත් නාථ දේව වන්දනය සම්බන්ධ නූතනවාදී අභිචාර මඟින් හෙළිවන බවත් වර්තමානයේ විකාසනය වී ඇති නාථ දේව වන්දනය ඓතිහාසිකව පරිණාමය වූවක් බවත් එය ථෙරවාද බුදුසමයට අනනුකූල මතිභ්‍රමයක් හෙවත් සාවද්‍ය සඞ්කල්පයක් නො වන බවත් දැක්විය හැකි ය. මෙනයින් ගත් කල සමකාලීන ආර්ය මෛත්‍රී නාථ දේව වන්දනය ලෙස හඳුන්වනු ලබන පිළිවෙත මඟින් ලෝකෝත්තර ආධ්‍යාත්මික ශක්තිය ලෞකික කරුණු මස්තකප්‍රාප්ත කර ගැනීම පිණිස ද යොදා ගැනීම ථෙරවාද බුදුසමය මුල් වූ සිංහල බෞද්ධ සංස්කෘතියේ අඞ්ගයක් බව ප්‍රවාදගත කර තැබිය හැකි ය.

**ප්‍රමුඛ පදඃ** අවලෝකිතේශ්වර, ථෙරවාද සම්ප්‍රදාය, දේව වන්දනය, නාථ දෙවියන්,  මෙත් බෝසතුන්


**මූලාශ්‍රය**

**ප්‍රාථමික මූලාශ්‍රය**

- සෝරත, වැලිවිටියේ (සංස්.). (1951). **ගිරා සන්දේශය.** කොළඹඃ රත්නාකර.
- **බුද්ධවංසපාළි.** සුමෙධකථා. බුද්ධජයන්ති ත්‍රිපිටක සංස්කරණ ග්‍රන්ථමාලා. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **මජ්ඣිමනිකාය. II**. සඞ්ගාරව සූත්‍රය. බුද්ධජයන්ති ත්‍රිපිටක සංස්කරණ ග්‍රන්ථමාලා. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- සුමංගල, හික්කඩුවේ හා බටුවන්තුඩාවේ (සංස්.). **මහාවංශය.** (සංස්.). මරදානඃ ගොඩගේ සහ සහෝදරයෝ. පුනර්මුද්‍රණය 1996.
- **සංයුත්තනිකාය. II**. ගොතම සූත්‍රය. බුද්ධජයන්ති ත්‍රිපිටක සංස්කරණ ග්‍රන්ථමාලා. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- Paranavithana, Senerath (ed.). Epigraphia.  Zeylanika. London: Oxford University Press.

**ද්විතීයික මූලාශ්‍රය**

- තල්වත්ත, අජිත් (2018). '**නාථ දේව වන්දනය සහ එහි සමාජ විද්‍යාත්මක වැදගත්කම පිළිබඳ අධ්‍යයනයක්.**' **The Journal of Studies in Humanities.** volume 4 November 1.
- තල්වත්ත, අජිත් (2017). '**ශ්‍රී ලංකාවේ දේශපාලනය සහ නාථ දෙවියන් ආඛ්‍යාන**' On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies Sabaragamuwa University of Sri Lanka, Volume 02 , Issue 01 , January – June 2017,  Article 01.
- සිල්වා, නලින් (2016). **බටහිර විද්‍යාව ආසනික් සහ දෙවියෝ.** නුගේගොඩඃ විසිදුනු.
- මේධානන්ද හිමි, වටද්දර (2009). **මෙතේ බුදුසිරිත නම් වූ අනාගත වංශය.** මරදානඃ ගොඩගේ.
- හේරත්, එච්. එම්. ආර්.ඩී. (සංස්.). (2016).) **පූජනීය දළදා සංස්කෘතිය.** 11 වන කලාපය මධ්‍යම පළාත් කෘෂිකර්ම හා පරිසර කටයුතු අමාත්‍යංශය.
- හෝල්ට්, ක්ලිෆර්ඩ් (1994). **මකුට මුනිධාරී අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය.** පී. බී. මීගස්කුඹුර (පරි.). කොළඹඃ ප්‍රදීප.